
අනුරපුරින් මැති සබයට
වෙනස් මනුස්සයෙක්.
චූලන්
කුමාර රත්නායක
අනුරාධපුරෙන්
9
සර්වජන බලය
சர்வஜன அதிகாரம் • SARVAJANA BALAYA
ව්‍යවසායකත්ව රාජ්‍යයක් - සතුටු දැයක්

# මාගේ දේශපාලන ප්‍රවේශය

රත්නායක මුදියන්සේලාගේ චූලන් කුමාර රත්නායක වන මම මහනුවර දිස්ත්‍රික්කයේ උපත ලබා, දැනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල, ඉහළ හල්මිල්ලෑව ප්‍රදේශයේ ගම් 13 ට නෑදෑකම් කියමින් වාසය කරමි. උසස් අධ්‍යාපනයෙන් පසු ව වසර 25 ක කාලයක් රජයේ ඉංග්‍රීසි ගුරුවරයෙකු, ඉංග්‍රීසි කථිකාචාර්යවරයෙකු මෙන් ම, ව්‍යවසායකයෙකු ලෙසත් ශ්‍රී ලාංකේය ගෙන්දගම් පොළොව තුළ කටයුතු කරමි. ශ්‍රී ලංකාවට රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය මෙන් ම අනෙකුත් ජාත්‍යන්තර භාෂාවන් ඉගැන්වීමේ හා වෘත්තීය අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් වන නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ සභාපතිවරයා (Institute of Official Languages and Professional Studies - IOLPS) වශයෙන් ද කටයුතු කරමි. එසේ ම, ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ජාත්‍යන්තරය හා සම්බන්ධ කරන දකුණු කොරියාව මුල් කර ගත් රටවල් 45ක් පුරා ක්‍රියාත්මක, ''තිරසර සංවර්ධනයක් සඳහා වූ ජාත්‍යන්තර තරුණ සංවිධානයේ'' (SDG Youth International) අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ද කටයුතු කරමි. එසේ ම, ශ්‍රී ලංකා විදෙස් වත්කම් කළමනාකරණ ඒජන්සිය හෙවත් (Ceylon Foreign Assets Management Agencies)හි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ද කටයුතු කරමි. මෙම ආයතනය ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන රැගෙන ඒම අරමුණු කොට මෙන් ම විදෙස් රැකියා සපයන ආයතනයක් ලෙස ද කටයුතු කරයි. එපමණක් නොව, සිසුන් 100 දෙනෙකුට නේවාසික පහසුකම් සමඟ නිදහස් හරිත පරිසරයක් තුළ ඉගෙන ගැනීමට පහසුකම් සපයා ඇති ග්‍රීන් විලේජ් කැම්පස්හි ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ද කටයුතු කරමි. මෙසේ මා හට ඇති අත්දැකීම් හා පළපුරුද්ද, දියුණු වීමට කැමැති, ස්වයං ව නැගී සිටීමට උත්සාහ කරන ශ්‍රී ලාංකේය ජනතාව වෙත ලබා දීමට අපේක්ෂිතයි. එසේ ම, ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ජාත්‍යන්තරය හා සම්බන්ධ කරන සුහද මිතුරෙකු ලෙස කටයුතු කිරීමට ද බලාපොරොත්තු වෙමි.

# රටෙන් මා ලද දෙයට මගෙන් රටට යමක්.

එසේ ම, මම නිදහස් අධ්‍යාපනයෙන් බිහි වූ මනුස්සයෙක් වෙමි. මා අධ්‍යාපනයෙන් පෝෂණය කිරීමට ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකු ම සුළුවෙන් හෝ දායක වී ඇත. දැන් කාලය උදා වී ඇත්තේ රටෙන් මා ලද දෙයට මගෙන් රටට යමක් ලබා දිය යුතු මොහොතටයි. මාගේ මෙම දේශපාලන ප්‍රවේශය සිදු වන්නේ රටට වගකියන, යුතුකම ඉටු කරන පුරවැසියන් බිහිකරන එක් ආදර්ශයක් වීම බව සටහන් කරමි.

මාගේ දේශපාලන ප්‍රවේශය සඳහා ව්‍යවසායක දිලිත් ජයවීර මැතිතුමාගේ ''සර්වජන බලය'' පක්ෂය සහ එහි ප්‍රතිපත්ති ගැළපීම සිදු වී ඇති බැවින් එම බල කඳවුර හරහා මෙවර අනුරාධපුර දිස්ත්‍රික්කයට සර්වජන බලයේ පදක්කම සංකේතය හා අංක 09 යටතේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සඳහා තරග වදිමි.

සර්වජන බලය පක්ෂයේ ප්‍රතිපත්තිවලට අමතර ව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවට ඇති ගැටලු විසඳීම සඳහා මට කළ හැකි හා මැදිහත් විය හැකි වැඩපිළිවෙලක් මේ සමඟ ඉදිරිපත් කරන අතර එම වැඩපිළිවෙල මා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම හෝ නොගැනීම මත නතර නොවන මාගේ පෞද්ගලික හැකියාව, සබඳතා හා මැදිහත්වීම මත ඉටු කිරීමට කටයුතු කරන බව ද මෙහිදී නිහතමානී ව සඳහන් කරමි.

## 1. පළමුවන වැඩපිළිවෙල

### සෑම නිවසක ම ඉංග්‍රීසි කතා කරන දරුවෙකු බිහි කිරීම.

ලෝකය ජය ගැනීම සඳහා අත්‍යවශ්‍ය ම ජාත්‍යන්තර භාෂාව වන්නේ ඉංග්‍රීසි භාෂාවයි. අද වන විට ශ්‍රී ලාංකිකයින් අතරින් ප්‍රතිශතයක් ලෙස 22% ක පමණ ප්‍රමාණයක් ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගෙන එය භාවිත කළ හැකි තත්ත්වයට පත් ව ඇති බව මෑත කාලයේ සිදු කරන ලද සමීක්ෂණයක් මගින් පෙන්වා දී ඇත.

මින් පෙනී යන්නේ අපගේ ජනතාව තුළ ඉංග්‍රීසි භාෂා දැනුම ප්‍රමාණවත් පරිදි වර්ධනය වී නොමැති බවත්, කඩිනමින් එය ප්‍රචලිත කළ යුතු ව ඇති බවත් ය.

මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ''සෑම නිවසක ම ඉංග්‍රීසි කතා කරන දරුවෙකු බිහි කිරීම'' යන තේමාව යටතේ මා විසින් ආරම්භ කර ඇති ව්‍යාපෘතිය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ කඩිනමින් ව්‍යාප්ත කිරීමට කටයුතු කරන අතර ඒ මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ දරුවන් කඩිනමින් සිය ඉංග්‍රීසි භාෂා දැනුම වැඩි දියුණු කර ගැනීම සිදු කර ගනු ඇත. එමෙන් ම, නව රැකියා අවස්ථාවන් රාශියක් ද මෙම ව්‍යාපෘතිය තුළින් බිහිකිරීමට සැලසුම් කර ඇත.

## 2. දෙවන වැඩපිළිවෙල

### ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ජාත්‍යන්තරයට රැගෙන යාම

අපගේ ශ්‍රී ලංකාව පුංචි දිවයිනක් වුව ද එහි ජීවත් වන ජනතාව බුද්ධිමත්කම අතින් ලොව කිසිදු ජාතියකට දෙවෙනි වන්නේ නැත. එහෙත්, අපගේ බුද්ධිමතුන් අතරින් ලෝකය තරණය කර ඇත්තේ ඉතාමත් ස්වල්ප දෙනෙකු පමණි. එයට හේතුව නම්, ප්‍රමාණවත් ජාත්‍යන්තර භාෂා දැනුමක් ලබා නොතිබීමත්, ජාත්‍යන්තරයට යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් පිළිබඳ ව අවබෝධයක් ලබා නොතිබීමත් වේ. එහෙත්, මාගේ මෙම වැඩපිළිවෙල තුළින් මම සූදානම් වන්නේ පෞද්ගලික ව මම ජාත්‍යන්තරය ජය ගත් ආකාරය ශ්‍රී ලාංකේය තාරුණ්‍ය සඳහා හඳුන්වා දීමත්, ඔවුන් සඳහා එම අවශ්‍ය මාර්ගය පෙන්වා දීමත් වේ. මේ මගින් මාගේ අපේක්ෂාව වන්නේ ශ්‍රී ලාංකේය තාරුණ්‍ය දැනුමෙන්, ආකල්පයෙන් හා කුසලතාවෙන් ශක්තිමත් කිරීමත්, ශ්‍රී ලාංකේය සභ්‍යත්වය ජාත්‍යන්තරයට රැගෙන යාමට ඔවුන් දිරි ගැන්වීමත්, ජාත්‍යන්තරය තුළ ඇති යහපත් දේ අපගේ රටට ගෙන ඒමට හැකි වන ලෙස ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ශක්තිමත් කිරීමත් වේ. මෙම වැඩසටහනෙහි වැඩි ප්‍රතිලාභ අනුරාධපුර ජනතාවට ලබා දීමත් මාගේ අධිෂ්ඨානයයි. මේ සඳහා ක්‍රමවත් උපාය මාර්ගික වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර එය 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ඇත. මෙම වැඩපිළිවෙල මගින් ගමේ සිටින තරුණයා/තරුණිය ඉතාමත් පහසුවෙන් ජාත්‍යන්තර සබඳතාවන් ගොඩනගා ගැනීම මෙන් ම තම ජීවන තත්ත්වය උසස් කර ගැනීම ද සිදු කර ගනී.

## 3. තුන්වන වැඩපිළිවෙල

### ගෘහස්ථ සංචාරක නවාතැන් ඒකක 1000ක් ස්ථාපිත කිරීම මගින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ගොඩනැගීම.

මෙම වැඩපිළිවෙල ඉහත දෙවන වැඩපිළිවෙලෙහි දිගුවක් වන අතර ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් ව ගොඩනගා ගන්නා ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම මේ මගින් සිදු කෙරේ. සිය නිවස තුළ ගෘහස්ථ සංචාරක ඒකකයක් ආරම්භ කිරීමත්, සම්පූර්ණ ඒකක දහසක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ඇති කිරීමටත් මේ මගින් පහසුකම් සැපයීමට අපේක්ෂා කරන අතර ජාත්‍යන්තර සංවිධානයන්හි සහය මෙම වැඩපිළිවෙල සාර්ථක කිරීම සඳහා ලබා දීමට අපේක්ෂිතයි. දකුණු කොරියාව මුල් කර ගත් රටවල් 45ක් පුරා ක්‍රියාත්මක ''තිරසර සංවර්ධනයක් සඳහා වූ ජාත්‍යන්තර තරුණ සංවිධානයේ'' සහ එහි ''ජාත්‍යන්තර තරුණ තානාපති'' ව්‍යාපෘතියේ සහය මේ සඳහා යොදා ගනී.

## 4. හතරවන වැඩපිළිවෙල

### මත්කුඩු සහ අනෙකුත් නීති විරෝධී කටයුතුවලින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ දරුවන් රැක ගැනීමට පෙරමුණ ගෙන කටයුතු කිරීම.

අපගේ රටේ අනාගතය දරුවන් මත රඳා පවතී. එම දරුවන් නිසි අයුරින් රැක බලා ගැනීම දෙමව්පියන්ගේ, ගුරුවරුන්ගේ, වැඩිහිටියන්ගේ මෙන් ම සමස්ත ජනතාවගේ වගකීමයි. එහෙත්,

වර්තමානය වන විට එම වගකීම ඉටු කිරීමට අදාළ අය උත්සාහ කළ ද සැලකිය යුතු ලෙස අපරාධ ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර මෙහි සැලකිය යුතු කොටසක් දේශපාලනයට ප්‍රවේශ වීමට ප්‍රථම ව ද මවිසින් ක්‍රියාත්මක කර ඇත. එම කාර්යයන් කාර්යක්ෂමතාවයකින් යුතු ව ඉටු කිරීම ඉදිරියේදී බලාපොරොත්තු වෙමි. එහි එක් පියවරක් ලෙස අපරාධ අවම කිරීම සඳහා නගරබද සහ ග්‍රාමීය ප්‍රදේශ මාර්ග ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතීන් සවි කර ආසන්න පොලිස් ස්ථානයට නිරීක්ෂණයට ලබා දීම සහ දිවයිනේ සියලු ම පොලිස් ස්ථාන සඳහා ඩ්‍රෝන කැමරා (Drone Camera) හඳුන්වා දීම මගින් පොලිස් ස්ථානය තුළ සිට ප්‍රදේශයේ අපරාධ හඳුනා ගැනීමට හා ඒවා පාලනය කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීමට යෝජනාවක්, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ගෙන ඒමට කටයුතු කරමි.

## 5. පස්වන වැඩපිළිවෙල

### දැනුම, ආකල්ප, කුසලතා සහ මානසික සංවර්ධනය සඳහා මග පෙන්වීමට සුදුසුකම් ලත් කණ්ඩායමකින් යුතු ස්වෙච්ඡා ඒකකයක් ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවීම.

අද අප රටේ දරුවන් හතර දෙනෙකුගෙන් එක් අයෙකුට කුමක් හෝ මානසික ආතතීන් තත්ත්වයක් දැකිය හැකි වේ. අධික කෝපය, අධ්‍යාපනයට නැඹුරු නොවීම, ජංගම දුරකථනය සඳහා ඇබ්බැහි වීම, අකීකරු වීම, අඩු වයසේ ප්‍රේම සබඳතාවන්, අඩු වයස් විවාහ, සිය දිවි හානි කර ගැනීම් ඒ අතර දැකිය හැකි වේ. එසේ ම, වැඩිහිටියන් අතර පවුලේ අසමගිය, දරුවන්ට හිරිහැර කිරීම, මත්පැන් පානය ආදී කරුණු මත මානසික අසහන තත්ත්වයන් දැකිය හැකි වේ. එසේ ම, ව්‍යාපාරිකයින් හා ව්‍යවසායකයින් අතර එම ව්‍යාපාර හෝ ව්‍යවසාය කඩා වැටීම තුළ ඇති වූ අධික මානසික ආතතීන් තත්ත්වයන්ට පත් ව ඇත. මෙම කණ්ඩායම් නැවත නගා සිටුවීම සඳහා හරවත් සැලැස්මක් සහිත ව ස්වෙච්ඡා ඒකකයක් ප්‍රාදේශීය මට්ටමින් ආරම්භ කිරීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී රජයේ මගපෙන්වීම ද ලබා ගැනීමට අපේක්ෂිතයි. මාගේ දේශපාලන ප්‍රවේශය තුළ මා විසින් ඉටු කිරීමට බලාපොරොත්තු වන තවත් එක් වැඩපිළිවෙලක් ලෙස මෙය හඳුන්වා දිය හැකි වේ. මෙම ඒකකය සඳහා ප්‍රදේශය තුළ සිටින උගත්, බුද්ධිමත්, නව අධ්‍යාපනය ලත් අයවලුන් සහ විශ්‍රාමික මහත්ම මහත්මීන්ගේ සහය ලබා ගැනීමට කටයුතු කෙරේ. අවශ්‍ය අය සඳහා දෙස් / විදෙස් පුහුණුවක් ලබා දීමට ද කටයුතු කෙරේ.

## 6. හයවන වැඩපිළිවෙල

### වෘත්තීය පුහුණුව ලබා දීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තරුණ/තරුණියන් 10000ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා පුහුණුවෙන් පසු ව නිසි ප්‍රායෝගික පුහුණුවකට යොමු කිරීම සහ විදෙස් රැකියා අවස්ථාවන් සඳහා මග පෙන්වීමට අපේක්ෂිතයි. මේ සඳහා දැනට මාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක ආයතනයන්හි සහය ලබා ගැනීමට නියමිතයි.

## 7. හත්වන වැඩපිළිවෙල

### පවුලේ ජීවන තත්ත්වයන් උසස් කිරීම සඳහා කාන්තාව බල ගැන්වීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දහස් ගණනක් වූ කාන්තාවන් විවිධ අංශයන්හි කුඩා ව්‍යාපාරයන් හා ස්වයං රැකියාවන්හි නිරත ව සිටී. එහෙත්, ඔවුන්ගේ නිෂ්පාදනයන් අලෙවි කර ගැනීමේදී නොයෙකුත්

දුෂ්කරතාවන්වලට මුහුණ දේ. එම දුෂ්කරතාවන් මග හැර තම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීමට කටයුතු කරන අතර නව ස්වයං රැකියා අවස්ථාවන් ඇති කිරීමටත් අවශ්‍ය අය සඳහා වැඩි දුර පුහුණුව ලබා දීමටත් කටයුතු කෙරේ.

## 8. අටවන වැඩපිළිවෙල

### කුඩා සහ මධ්‍ය පරිමාණ සහල් මෝල්හිමියන් නැවත බලගැන්වීම සහ සහල් සැපයීම ස්ථාවර කිරීම.

අද වන විට ශ්‍රී ලංකාවේ සහල් ඒකාධිකාරය මහා පරිමාණ සහල්මෝල් හිමියන් විසින් තබා ගෙන ඇත. ඒ මගින් ඔවුන් සහල් මිල පමණක් නොව, වී මිල ද තමන්ට අවශ්‍ය පරිදි පාලනය කරමින් ඇත. අවශ්‍ය ආකාරයට ක්ෂණික ව රට තුළ සහල් හිඟ මැවීම ඔවුන් විසින් සිදු කරයි. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ක්‍රමවත් සැලැස්මක් යෝජනා කරන අතර ඒ සඳහා කුඩා සහල් මෝල් හිමියන් සහ ඒ ආශ්‍රිත ගොවියන් ඒකාබද්ධ කර සහල් නිෂ්පාදනයට කටයුතු කිරීමත්, එම නිෂ්පාදනය කරනු ලබන සහල් අලෙවිය සඳහා නව සහල් ව්‍යවසායකයෙකු ඇති කිරීමටත් සැලසුම් කර ඇත. එවිට කුඩා සහල් මිල හිමියන් විසින් නිෂ්පාදනය කරනු ලබන සහල් තම පළාත තුළ සහ ඉන් පිටත ක්‍රමවත් ලෙස බෙදා හැරීම සිදු කෙරේ. රටේ සහල් මිල පාලනය කිරීම සඳහා යම් පිටිවහලක් මේ මගින් ලැබීම මෙන් ම ගමේ මුදල් ගම තුළ සංසරණය වීම මෙහි ඇති එක් ප්‍රධාන වටිනාකමකි.

## 9. නවවන වැඩපිළිවෙල

### රෙදිපිළි ආශ්‍රිත රැකියාවන්හි නියුතු කාන්තාවන් සඳහා විකල්ප අවස්ථාවන් හඳුන්වා දීම.

රෙදිපිළි ආශ්‍රිත කර්මාන්තයන්හි සේවයේ නියුතු කාන්තාවන් අතරින් විදෙස් ගතවීමට අවශ්‍යතා ඇති අය හඳුනාගෙන ඒ අය සඳහා කෙයා(ර්)ගිව(ර්) (Care Giver) පුහුණුව හා ඉංග්‍රීසි භාෂා පුහුණුව ලබා දීම හා ඔවුන් ව විදෙස් ගතකිරීමට අවශ්‍ය කටයුතු සකස් කිරීමට අපේක්ෂිතයි. මෙම වැඩපිළිවෙල මගින් එම රැකියාවන්හි නිරත වන කාන්තාවන්ගේ හා ඔවුන්ගේ පවුලේ ජීවන තත්ත්වයන් උසස් කිරීමට සැලසුම් කෙරේ.

## 10. දසවන වැඩපිළිවෙල

### තම වගා බිමේ කුලීකරුවන් බවට පත් වූ අහිංසක ගොවියන් නැවත ඉඩම් හිමි ගොවියන් බවට පත් කිරීමට මැදිහත්වීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා කටයුතුවල නිරත වන බොහෝ ගොවීන් උරුමයෙන් හෝ මහවැලි ව්‍යාපෘතිය යටතේ ඉඩකඩම් හිමි ව බොහෝ දුෂ්කරතාවන් මධ්‍යයේ ගොවිතැන් කටයුතු කරමින් ජීවත් වන පිරිසකි. ගොවියන් අතරින් අතළොස්සක් පමණක් ගොවි ව්‍යවසායකයින් වී දියුණුවට පත් ව ඇත. තවත් පිරිසක් තම කුඹුරු ඉඩම් උකස් කර ඇත්තේ දරුවන්ගේ පවතින අවශ්‍යතාවන් හෝ වෙනත් අත්‍යවශ්‍ය ම කරුණු සම්පූර්ණ කර ගැනීම වෙනුවෙනි. කෘෂි ආම්පන්න මිල ඉහළ යාම, බෙහෙත් පොහොර මිල, සත්ත්ව හානි, ස්වභාවික විපත් හා අස්වැන්නට නිසි මිලක් නොමැතිකම ද ගොවීන්ගේ ආර්ථික ගැටලුවට හේතූන් වේ.

එසේ ම, කුඹුරු ඉඩම් උකස් කරන ලද ගොවියන් තම ඉඩම්වල ම කුලීකරුවන් බවට පත් ව ඇත්තේ එම ඉඩම් නැවත බේරා ගැනීමට නියමිත ක්‍රමවේදයක් නොමැති නිසාවෙනි. එම ගැටලුව විසඳීම සඳහා තිරසර වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර නිශ්චිත කාලයක් තුළ තම ඉඩම් නැවතත් තමන්ට ම ලබා ගැනීමට මේ මගින් හැකියාව ලැබේ.

## 11. එකොළොස්වන වැඩපිළිවෙල

**භික්ෂූන් වහන්සේලා සියක් නමක් සඳහා ධර්ම ප්‍රචාරයට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දීම වෙනුවෙන් එක් අවුරුදු ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාවක් ක්‍රියාත්මක කිරීම.**

සූත්‍ර, විනය හා අභිධර්ම පිටකය වැනි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය අද ශ්‍රවණය කළ හැක්කේ පාලි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් පමණි. මෙම ධර්මස්කන්ධය ඉංග්‍රීසි භාෂාවෙන් ජාත්‍යන්තරයට ගෙන යා හැකි හිමිවරුන් හා පඬිවරුන් ඉතා සීමිත සංඛ්‍යාවක් පමණක් වර්තමානයේදී වැඩ සිටී. ධර්මය උගත් භික්ෂූන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් අතරින් 100 නමක් වහන්සේලා තෝරා ගෙන එම හිමිවරුන්ගේ ඉංග්‍රීසි භාෂා ඥානය වර්ධනය කිරීම සඳහා අංග සම්පූර්ණ ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් නොමිලේ පැවැත්වීමට 2025 වසරේදී කටයුතු කෙරේ.

## 12. දොළොස්වන වැඩපිළිවෙල

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ එළවළු හා පලතුරු අස්වැන්න අපනයනය කර ගැනීමට අවශ්‍ය මැදිහත්වීම ලබා දීම.**

අඹ, කෙසෙල් ඇතුළු පලතුරු හා එළවළු අස්වැන්න අපනයනය කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීමට සැලසුම් කර ඇත. ඒ සඳහා මාගේ පෞද්ගලික ජාත්‍යන්තර සබඳතාවන් භාවිත කරන අතර මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණය අවසන් වූ වහා ම අදාළ ගොවීන් හා සාකච්ඡා කිරීමට කටයුතු කරමි.

## 13. දහතුන්වන වැඩපිළිවෙල

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපාරිකයින් අතරින් අවශ්‍ය අය සඳහා ජාත්‍යන්තර හවුල්කරුවන් සම්බන්ධ කර දීමට කටයුතු සැලසීම.**

මේ මගින්, ජාත්‍යන්තරය හා සම්බන්ධ වී ව්‍යාපාරික කටයුතු කිරීමට කැමැති ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කෙරේ. අවශ්‍යතාවයන් ඇති ව්‍යවසායකයින් සඳහා ජාත්‍යන්තර ආයෝජකයින් හා ව්‍යාපාරිකයින් සම්බන්ධ වන සමුළුවක් අනුරාධපුරදී පැවැත්වීමට කටයුතු කෙරේ.

## 14. දාහතරවන වැඩපිළිවෙල

දැනට වාණිජ වටිනාකම් ලෙස හඳුනා නොගත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ව වැවෙන බෙහෙත් කරඳ, කොහොඹ, ඉඟිනි, මී වැනි ශාකවලින් ලබාගන්නා තෙල් සඳහා විදෙස් වෙළෙඳපොළ සොයා දීම මගින් පවුලේ ආර්ථික තත්ත්වයන් නගා සිටුවීමට කටයුතු කෙරේ.

## 15. පහළොස්වන වැඩපිළිවෙල

**මී මැසි පාලනය වෘත්තීය මට්ටමට රැගෙන ඒමට කටයුතු කිරීම.**

ශ්‍රී ලංකාවේ මී පැණි සඳහා ඇත්තේ ඉතා ම ඉහළ ඉල්ලුමකි. එසේ සිදුවන්නේ රසය, ගුණය මෙන් ම ඖෂධීය වටිනාකම ද සැලකිල්ලට ගනිමිනි. මා විසින් හඳුන්වා දෙන වැඩපිළිවෙල මගින් මී මැසි

පාලනය වෘත්තීය මට්ටමට රැගෙන එන අතර මී මැසි පාලනය මගින් ලැබෙන ප්‍රතිලාභ එම කාර්යයේ නිරත වන ගොවියාට පමණක් නොව, පරාගනය තුළින් සිදු වන අස්වනු ඉහළ නැංවීමේ පොදු ප්‍රතිලාභය ද සමස්තයට ලබා දීමට නියමිතයි.

## 16. දහසයවන වැඩපිළිවෙල

### වන අලි ගම් වැදීම  අවහිර කිරීමට ස්වභාවික ක්‍රමවේදයක් සකස් කිරීම.

අද වන විට අලි මිනිස් ගැටුම උග්‍ර අතට හැරී ඇත. එක දිනක මිනිසෙකු අලි ප්‍රහාරයෙන් මිය ගොස් සිටින බව අපට අසන්නට ලැබෙන විට තවත් දිනක මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් අලින් මිය ගොස් සිටින බව අපට අසන්නට ලැබේ. මිනිසා අපගේ පෘථිවියේ සිටින බුද්ධිමත් ම සත්ත්වයා වුවද ඔහු ඔහුගේ ඥානය හරි හැටි භාවිත කරන බවක් නොපෙනේ. නොඑසේ නම්, මෙම අලි මිනිස් ගැටුම විසඳීම සඳහා උවමනාවක් ඇති බවක් නොපෙන්වයි. මාගේ  දේශපාලන ප්‍රවේශය තුළ සෑම ගැටලුවක් සඳහාම ඉදිරිපත් කරන්නේ ප්‍රායෝගික විසඳුම් වන අතර මෙම අලි මිනිස් ගැටුම විසඳීමට ද  වැඩපිළිවෙලක් ඉදිරිපත් කරමි.

මාගේ වැඩපිළිවෙල පියවර හතරකින්  යුක්ත වේ.

01. අලි ඇතුන් හට ගම් වැදීමට නොහැකි වන ලෙස ස්වභාවික ආවරණ වැටවල් දෙකක් ඉදි කිරීම. එනම්, පළමු වැට  ලෙස දෙහි හා ලෙමන් වැටක් වනාන්තරයට සමීපයෙන් ම වැවීම.

02. දෙවන වැට  ලෙස තල්  වැටක් ඉදි කිරීම.

03. දෙහි සහ ලෙමන් වැට  අතර සමාන්තර දුරකින් සිටින සේ මී මැසි පාලනයක් වෘත්තීය මට්ටමින් ගම්  වැසියන්ගේ සහභාගිත්වයෙන් යුතු ව ආරම්භ කිරීම.

04. අලි ඇතුන් සඳහා ආහාර අවශ්‍යතාවන් කැලය තුළින් ම සපයා ගැනීම සඳහා සුදුසු වර්ගයේ බීජ කැලය තුළ වැපිරීම සහ අවශ්‍ය  ජල පහසුකම් සැපයීම.

## 17. දහහත්වන වැඩපිළිවෙල

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ දරුවන් සඳහා නොමිලේ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දීම.

මෙම වැඩපිළිවෙල මගින් 06 වන ශ්‍රේණියේ  සිට 09 ශ්‍රේණිය  දක්වා සිසු දරුවන් 25000 කට නොමිලේ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දීමට සැලසුම් කර ඇත.

## සමාප්තිය....

මාගේ දේශපාලන ප්‍රවේශය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ඇති වගකීම සහ ජනතාවට ඉටු විය යුතු යුතුකම ලෙස සලකා මට කළ හැකි කාර්යයන් මෙම වැඩපිළිවෙල තුළින් ඉදිරිපත් කර ඇත. මාගේ වැඩපිළිවෙල පිළිබඳ ව සෑහීමකට පත්වන්නේ නම් මෙවර පැවැත්වෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී **පදක්කම සලකුණින්, සර්වජන බලය තුළින් අංක 09** යටතේ ඉදිරිපත් වන මා හට ඔබගේ මනාපය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි. මැතිවරණයෙන් පසුව ද මා ඉදිරිපත් කර ඇති කරුණු ඉටු කිරීමට මම තව දුරටත් අදහස් කරන බැවින්, ජයග්‍රහණය හෝ පරාජය කුමක් වූවත් මාගේ

වැඩපිළිවෙල හා සම්බන්ධ වී ඔබට මාගෙන් ලබා ගත හැකි යම් සේවයක් පවතින්නේ නම්, එය ලබා ගන්නා ලෙස ගෞරවයෙන් දන්වා සිටිමි.

## ඔබට ජය

මෙම මැතිවරණ ප්‍රකාශයේ සටහන් කර ඇති වැඩපිළිවෙල ඉටු කිරීමට මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණයට තරග වදින **චූලන් කුමාර රත්නායක** වන මම සැලසුම් කර ඇත. මාගේ වැඩපිළිවෙල කෙරෙහි ඔබගේ  යම් කැමැත්තක් ඇත්නම් පදක්කම සලකුණ යටතේ අංක 9ට ඔබගේ වටිනා ඡන්දය ප්‍රකාශ කරන ලෙසත් මේ  තුළින් යම් ප්‍රතිලාභයක් ලබා ගැනීමට ඔබත් අදහස් කරන්නේ නම්  පහත සඳහන් ක්‍රමවේදයන් මගින්  මා හා සම්බන්ධ වන්න.

චූලන් කුමාර රත්නායක, ග්‍රීන් විලේජ් කැම්පස්, ඉහළහල්මිල්ලෑව, එප්පාවල.

01. දුරකථන අංක. 071 6 77 77 57

02. WhatsApp. 071 6 88 27 77

